(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **111.**]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025** නොවැම්බර් **26** බදාදා පූ.භා. **9.00** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **කේ.ඩී. ලාල් කාන්ත මහතා,** කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **විජිත හේරත් මහතා,** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **(ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය,** ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත ජයවීර මහතා,** ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරවින්ද සෙනරත් මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිනිඳු සමන් හෙන්නායක මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු අබූබකර් අතම්බාවා මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා

ගරු ජේ.සී. අලවතුවල මහතා

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු බී. ආරියවංශ මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා

ගරු ඔෂානි උමංගා මහත්මිය

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු අමිල ප්‍රසාද් මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්‍ෂ මහතා

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ආර්.ජී. විජේරත්න මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යාලිංගම් මහතා

ගරු තිළිණ සමරකෝන් මහතා

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**

**ගරු චන්දන සූරියආරච්චි මහතා**

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**

**ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු දිනේෂ් හේමන්ත මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදනය කරන ලදී:—

"ගරු මන්ත්‍රීවරුනි,

පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනා විවාදයට ගැනීමට අවස්ථාව ලබාදීමේ දී එකී යෝජනා භාර දී ඇති සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට එක හා සමාන අවස්ථාවන් ලැබෙන බවට සහතික කිරීම පිණිස දැනට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ දී පදනම් කරගනු ලබන ක්‍රමවේදයම, පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනා විවාදයට ගැනීමට අවස්ථාව ලබාදීමේදී ද යොදා ගන්නා ලෙසට මන්ත්‍රීවරයන් විසින් කරනු ලැබූ ඉල්ලීම අනුව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ අනුමැතිය මත සකස් කරන ලද නව ක්‍රමවේදය 2025.11.18 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී දීර්ඝ වශයෙන් සලකා බැලීමෙන් අනතුරුව, එකී නව ක්‍රමවේදය 2026 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට කාරක සභාව තීරණය කරන ලද බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව, මීළඟට පෞද්ගලික මන්ත්‍රී යෝජනා විවාදයට ගැනීමට නියමිත 2026 ජනවාරි මස සිට මෙම නව ක්‍රමවේදය අනුව පෞද්ගලික මන්ත්‍රී යෝජනා විවාදයට ගැනීමට අවස්ථාව සලසන බවත්, යෝජිත නව ක්‍රමවේදය අනුව, පළමු දිනය සඳහා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරනු ලබන යෝජනා සංඛ්‍යාව ඒ වනවිට න්‍යාය පුස්තකයේ/න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකයේ කාලානුක්‍රමික අනුපිළිවෙළ මත යෝජනා ඇතුළත් මන්ත්‍රීවරයන්ගේ පිළිවෙළ මත තෝරනු ලබන අතර, ඊළඟ මාසයේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා විවාදයට ගනු ලබන දිනය සඳහා යෝජනා තෝරා ගැනීමේ දී, කාලානුක්‍රමිකව ඊළඟට යෝජනා ඉදිරිපත් කර ඇති මන්ත්‍රීවරයන්ට ද අවස්ථාව ලැබෙන පරිදි යෝජනා විවාදය සඳහා තෝරා ගනු ලැබේ. එහි දී අදාළ මන්ත්‍රීවරයන් විසින් තම නමින් පළ කර ඇති යෝජනා අතරින් පළමුවෙන්ම විවාදයට ගැනීමට අපේක්ෂා කරනු ලබන හෝ ප්‍රමුඛතාවය ලබාදිය යුතු යෝජනාව සඳහන් කරන්නේ නම්, ඒ සම්බන්ධව ද සැලකිල්ලට ගනු ලබන බවත් වැඩිදුරටත් සඳහන් කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව, පෞද්ගලික මන්ත්‍රී යෝජනා ඉදිරිපත් කර ඇති සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් හට සමාන අවස්ථාව ලබාදීමේ අරමුණින් ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම නව ක්‍රමවේදය සාර්ථක කර ගැනීම සඳහා සියලුම ගරු මන්ත්‍රීවරයන්ගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කරමි.”

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් —

(i) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ඔක්තෝබර් 09 දිනැති අංක 2457/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) (235 අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධ යෝජනා සම්මතය

(2025 ඔක්තෝබර් 09 දිනැති අංක 2457/06 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

ඉදිරිපත් කර, එම නියමය සහ යෝජනා සම්මතය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

බණ්ඩාරවෙල, වැවතැන්න, රෝහල පාර, අංක 48/19 දරන ස්ථානයෙහි පදිංචි කේ.එම්. මානවසිංහ බණ්ඩාර මහතාගෙන් ලැබුණු 2025.06.09 දිනැති පෙත්සම ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— ශ්‍රී ලංකා ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; මුදල් ණයට දීමේ ව්‍යාපාරය සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය නියාමනය කිරීම සඳහා ද; මුදල් ණයට දීමේ ව්‍යාපාරයේ සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයේ ගනුදෙනුකරුවන්ට ආරක්ෂාව සැපයීම සඳහා ද; 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත ඉවත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2025 දෙසැම්බර් 10 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**5. විසර්ජන පනත් කෙටුම්පත— (දහසයවැනි වෙන් කළ දිනය):** කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

ශීර්ෂය 151

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ගරු දිලිප් වෙදආරච්චි මහතා ඉදිරිපත් කළ යෝජනාව,— "වැඩසටහන රුපියල් 10/- කින් අඩු කළ යුතු ය".

(පූ.භා. 10.36 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

(අ.භා. 2.19 ට ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 3.06 ට ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.00 ට ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 5.04 ට ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

**ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 28 වැනි පිටුවේ 16 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"මූලධන 7,700,000,000"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 151 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 460,800,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 151 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 104,800,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 29 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"වැඩසටහන 02 සංවර්ධන වැඩසටහන 2,381,500,000 7,209,800,000"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 290

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 29 වැනි පිටුවේ 5 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"වැඩසටහන 01 මෙහෙයුම් වැඩසටහන 1,257,700,000 385,400,000"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 33 වැනි පිටුවේ 5 සහ 6 වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"පුනරාවර්තන 3,170,000,000

මූලධන 3,600,000,000"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 196

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 196 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 218,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 196 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 27,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 33 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"වැඩසටහන 02 සංවර්ධන වැඩසටහන 2,952,000,000 3,573,000,000"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 30 වැනි පිටුවේ 16 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"පුනරාවර්තන 6,400,000,000"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 186

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 186 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 241,500,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 186 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 25,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 31 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"වැඩසටහන 02 සංවර්ධන වැඩසටහන 3,812,500,000 8,128,500,000"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 227

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 227 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 2,346,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 227 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 1,946,500,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අනතුරුව සභාපති ප්‍රගතිය වාර්තා කළ යුතු යැයි ද, නැවත රැස්වීමට අවසර ගත යුතු යැයි ද විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 නොවැම්බර් 27 බ්‍රහස්පතින්දා.

**6. කල් තැබීම (රජයේ ඉඩම් භුක්ති විඳින ජනතාවට සින්නක්කර ඔප්පු ලබා දීම):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ. භා. 6.30 පසුකර තිබූයෙන්, අ. භා. 6.52 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව පාර්ලිමේන්තුව 2025 නොවැම්බර් 13 සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 27 බ්‍රහස්පතින්දා පූ. භා. 9.00 වනතෙක් කල් ගියේ ය.